
# ජේ.බී. ඇහැලේපොල මහතා



වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිරගන්දහය කෝරළයේ දොරටියාව ග්‍රාමයෙහිල 1943 නොවැම්බර් මස 04 වන දින ඇහැලේපොල උඩවලව්වේ දිසානායක බණ්ඩාරලාගේ උභයකෝන් බණ්ඩාර ඇහැලේපොල හා රාජපක්ෂ ලංකාතිලක බණ්ඩාරනායක අතපත්තු වාසල මුදියන්සේ රාලහාමිලාගේ දයාවතී කුමාරිහාමි යන දෙපලගේ වැඩිමහල් දරුවා ලෙස ජයනන්ද බණ්ඩාර ඇහැලේපොල උපත ලැබිය.

පවුලේ සහෝදර සහෝදරියන් දස දෙනෙකු වන අතර සහෝදරයින් 06 ක් හා සහෝදරියන් 03 දෙනෙකි.



දෙමාපියන්ගේ විවාහ මංගල ඡායාරූපය




මඩහපොල පරණ වලව්වේ ඡායාරූපයක්

## පාසැල් අධ්‍යාපනය

මූලික අධ්‍යාපනය කුරුණෑගල දොරටියාව රජයේ මිශ්‍ර පාසැලින් ලබා ගත් අතර

1954 වසරේ කුරුණෑගල මලියදේව විද්‍යාලය ඇතුලත්ව උසස්පෙල දක්වා ඉගෙනීම් කටයුතු හදරා ඇත.



වයස අවුරුදු 15 දී පමණ ලබාගන්නා ලද ඡායාරූපයක්





මලියදේව විද්‍යාලයීය ගැමුණු නිවාසයේ ඡායාරූපයක්

## පාසැල් අධ්‍යාපනයෙන් පසු

1970.02.01 දින සිට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සේවය ආරම්භ කල අතර 1981.03.31 දින සේවයෙන් විශ්‍රාම ගොස් ඇත. (එවකට පැවති රජය විසින් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව නවතා දමා අහෝසි කිරීම හේතුවෙන් වසර 10ක් ඉක්මවූ සේවකයින් අඩු වයසින් විශ්‍රාම ගන්වා ඇත.) විශ්‍රාම යන විට වයස අවු. 38 කි.

1984 වර්ෂයේ නැවත කුරුණෑගල පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී ලෙස පත්වී 2001 වසර දක්වා වර්ෂ 17ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලදී.



තරුණ අවධියේ ඡායාරූපයක්.

## විවාහය

1973 වසරේ මාතු මස 23 වන දින නැකැත්තේ ඒකනායක මුදියන්සේ රාලහාමිලාගේ රම්‍යතිලකා ඒකනායක සමග විවාහය සිදු විය.



විවාහ මංගල ඡායාරූප

# දරුවන්

දියණිය බිම්බා ප්‍රියංගිකා ඇහැලේපොල


හරීන්ද්‍ර බණ්ඩාර ඇහැලේපොල පුත්‍රයා වන අතර ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වන අතර දැනට කුරුණෑගල අධ්‍යාපන කලාප කාර්යාලයේ සේවයේ නියුතුව සිටී.

## අනෙකුත් විස්තර

කුඩා කාලයේ සිට පවුලේ ඥාති සබඳතාව මත එවකට ඉබ්බාගල රජමහා විහාරාධිපති ලෙස වැඩ සිටි ගෞරවණීය වයඹ පලාතේ අධිකරණ සංඝනායක නැකැත්තේ ශ්‍රී ආනන්ද නායක ස්වාමීන් වහන්සේ ඇසුරෙහි වැඩෙමින් කාලය ගතකල අතර උන්වහන්සේගේ මග පෙන්වීමෙන් ජීවිතයට එක් රැස් කල ගුණධර්මයන් ප්‍රයෝජනයට ගනිමින් 1964 වසරේ පමණ සිට කුරුණෑගල මලියදේව මහා පිරිවෙනෙහි පුස්තකාලයට සම්බන්ධ වෙමින් සේවාව ආරම්භ කලහ. 1965 වසරේදී ආනන්ද ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ කල නගරයේ පලමු ලමා නිවාසය වන මලියදේව ලමා නිවාසයෙහි ආරම්භක පාලකවරයා ලෙස කටයුතු කරමින් සිට මිය යන මොහොත තෙක් එහි සභාපතිත්වය දරමින් වසර 57ක් තුල විශාල සේවයක් ඉටු කලහ. පසුකාලීනව ලමා නිවාස සමිතිය මගින් පාලනයේ පිහිටුවන ලද වැඩිහිටි සන්ධ්‍යා ගම්මානය ආරම්භ කරමින් අසරණ දරුවන් මෙන්ම මහලු වසයේ පසුවන වැඩිහිටියන් යන දෙකොට්ඨාශය රැකබලා ගැනීමට සෑහෙන කැපවීමෙන් වෙහෙස මහන්සි වී සේවයෙහි නිරත විය.



පූජ්‍ය නැකැත්තේ ශ්‍රී ආනන්ද නාහිමිපාණෝ





මලියදේව පිරිවෙන් පුස්තකාලයේ කටයුතු කරන අවධියේ ලබාගත් ඡායාරූප.

# නිලතල හොබවමින් සාමාජිකත්වය දැරූ සමිති සමාගම්


- කු/මලියදේව විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමයේ 1963 වර්ෂයේ සිට සාමාජිකත්වය දරා, 1990 දශකයේ මුල්භාගයේදී සම ලේකම්වරයෙකු ලෙස කටයුතු කර, මියයන තෙක් එහි අනුශාසක වරයෙකු ලෙස කටයුතු කලේය.





- 1991 වර්ෂයේ මලියදේව විද්‍යාලයේ ආදිශිෂ්‍ය සුභසාධක සංගමය ආරම්භ කිරීම උදෙසා මූලිකත්වය ගෙන ක්‍රියා කල අයෙකි. සුභසාධක සංගමයේ විවිධ තනතුරු හොඹවා ඇත.





මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය
MALIYADEVA COLLEGE OLD BOYS ASSOCIATI
NEGOMBO RD, KURUNEGALA.
YOUR REF ______ OUR REF ______ DATE 31.07.91


1991.07.28 ... 1991.08.03 ... 10.00 ...

- කුරුණෑගල මලියදේව විද්‍යාරක්ෂක පිරිවෙන් සභාව
- මලියදේව ලමා නිවාස සමිතිය - මිය යන විට සභාපතිත්වයේ.
- මලියදේව බාලිකා විද්‍යාල පාසල් සංවර්ධන සමිතිය (1980 - 1993)
- සමත මණ්ඩල සාමාජික වසර 20 කි.
- කුරුණෑගල තරුණ බෞද්ධ සංගමය


| | |
|---|---|
| 1981.11.02 - 1984 | අනුකාරක සභා ලේකම් |
| 1985 - 1994 | උප ලේකම් |
| 1994 - 1998 | ලේකම් |
| 1998 - 2001 | උප සභාපති |
| 2001.03.31 - 2006.07.28 | සභාපති |

- 1992 වයඹ ජයග්‍රහණය සංවිධානය
- 1995 මැයි 07 ඇතුගල්පුර බුදුරුව සංවර්ධන සමිතිය
- 2000 මාර්තු 18 හස්තිශෛලපුර බුදුරුව සමිතිය

2003 ඔක්තෝම්බර් 20 දින පෙ.ව. 10.30 ට යෙදුන සුභ මොහොතින් ඇතුගල බුදු පිලිම වහන්සේ සියම් මහා නිකායික අස්ගිරි පාර්ශ්වයේ මහා නායක ගෞරවණීය අතිපූජ්‍ය උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත හිමි ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් සාසනයට පූජා කිරීම.







ඇතුගල බුදුරුව ශාසනයට පූජා කිරීම.

- කුරුණෑගල දිස්ත්‍රික් විශ්‍රාමිකයින්ගේ සංගමයේ මියයනවිට ද සභාපති ලෙස කටයුතු කරන ලදී.
- කුරුණෑගල බාලදක්ෂ මූලස්ථානයේ සභාපතිවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර බාලදක්ෂ ව්‍යාපාරය වෙනුවෙන් ඉටුකල මෙහෙය අගයා 2022 මැයි මස ජනාධිපති පදක්කමකින් පිදුම් ලබා ඇත.
- කුරුණෑගල සමූපකාර ආරෝග්‍යශාලා සමිතියේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස වසර ගණනාවක් කටයුතු කර ඇත.
- වයඹ පිළිකා ඒකකයේ ආරම්භක සාමාජිකයෙකි.
- ගැට්ටුවාන අවමංගල්‍යාධාර සමිතිය
- දකුණු රවුම්පාර සුභ සාධන සමිතිය
- ඇත්කඳ රජ මහා විහාරය දායක සභා සාමාජික.
- කොටකන්ද රුවන්බෝධි පිරිවෙන දායක සභා සාමාජික.

# රචිත ග්‍රන්ථ

- 2007.01.01 " වයඹ අභිමානයේ පියසටහන් " නමින් ග්‍රන්ථයක් එළි දක්වන ලදී.

ඇතුලත් කරුණු :- වයඹ පලාතේ ඉතිහාසය

කුරුණෑගල යුගය


තරුණ බෞද්ධ සමිතියේ ඉතිහාසය හා ආරම්භය


මලියදේව පරම විද්‍යාරත්න බෞද්ධ සංගමයේ ආරම්භය

මලියදේව විද්‍යාලයේ ආරම්භය

මලියදේව බාලිකා විද්‍යාලය ආරම්භය


කරුණු සනාථ කිරීම සඳහා අදාල ඓතිහාසික මූලාශ්‍ර හා ලේඛන ඡායාරූප සහිතව එලකර ඇත.




බුදු සිරිතෙන් පැන විසඳුම් " - ප්‍රශ්නෝත්තර පොත


## ලැබූ ගරු නාම සහ සන්නස් පත්‍ර කිහිපයක්













අභාවය : 31-12-2022

එතුමන්ට නිවන් සුව අත්වේවා !

තොරතුරු : හරීන්ද්‍ර බණ්ඩාර ඇහැලේපොල